**මඩකලපුව මහ නගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 15 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාවට යවා තිබුණි.

## 1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 අහිතකර මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් නිශ්චල දේපල වන ඉඩම් හා ගොඩනැගිලිවල සමුච්චිත අගය මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | වත්කම්වල සමුච්චිත අගය ගිණුම් වල දැක්විය යුතුවේ. | ඉඩම්, ගොඩනැගිලි හා මංමාවත් සඳහා අගය කිරීමක් මේ දක්වා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරියේදි පියවරෙන් පියවර කමිටුවක් මගින් මේවා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කෙරේ. |
| (ආ) | යන්ත්‍ර, වාහන, ලීබඩු හා උපකරණ සහ පුස්තකාල පොත් ආදියේ සමුච්චිත පිරිවැය රු. 261,784,806ක් ලෙස දක්වා තිබුණත්, ඉන් වෙන්දේසි මගින් ඉවත් කළ වත්කම්වල පිරිවැය ඉවත් කර නොතිබුණි. | ඉවත්කළ වත්කම්වල පිරිවැය සමුච්චිත වටිනාකමින් ඉවත්කළ යුතුවේ. | මේ දක්වා කාලයක් මේවා තක්සේරු කර නිවැරදි කර නොමැති බැවින් වෙන්දේසි කළ වත්කම්වල පිරිවැය දැනගත නොහැක. ඉදිරියේදි කමිටු මගින් මේවා තක්සේරු කර වෙන්දේසි කිරීමේදි එහි පිරිවැය අඩුකිරීමට කටයුතු කෙරේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කිසිදු කාර්ය/සැපයුම්/සේවා/භාණ්ඩයක් ලබානොගෙන තිබියදී අවස්ථා 12 කට අදාලව ගෙවිය යුතු ලෙස රු.31,986,900 ක් ගිණුම්ගත කර තිබුණි. මෙයින් රු.16,281,020 ක් වර්ෂ | ඉදිරියේදී නිවැරදි කල යුතු වේ. | ඉදිරියේදී මෙම වරද සිදු නොවීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | දෙකකට පසුවද ගෙවිය යුතු ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. | | |
| (ඇ) | Double Cab වාහනය සහ බස් රථයෙහි ගැනුම් මිල රු.14,008,572 ක් වන අතර සභාවේ අරමුදල් උපයෝගී කර ගනිමින් මිලදී ගත් බව මූලික ලේඛනවලින් සඳහන් කර තිබුණත්, මෙම වටිනාකම මූලධන වියදම් සඳහා වූ රජයේ ආධාර ගිණුමට හර කර තිබුණි. | නිවැරදිව වාහන සඳහා ගිණුම් තැබිය යුතු වේ. | වාහන සඳහා පිරිවැය රු. මිලියන 14 ම සභාවේ අරමුදලින් මිලදීගෙන තිබුණත්, මෙය සභාවට අයත් බැවින් අදාල වාහන ගිණුමට හර කර වත්කම් වැඩිකර දක්වා මූලධන වියදම් සඳහා රජයේ ආධාර ගිණුමට හර කර තිබුණි. |
| (ඉ) | බාහිර ආයතනවල උපකාරයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලට අදාල ආදායම් හා වියදම් රු.33,410,387ක් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | අනාගතයේදි එය නිවැරදිව කළ යුතුවේ. | මෙලෙස අනෙකුත් ආයතනවලින්ලැබුණු කාර්යයන් (PSDG, CBG හැර) අත්තිකාරම් ලෙස ලබාදුන් බැවින් මුදල් ප්‍රවාහයන් ලෙස ගිණුම්වල දක්වා නොමැත. (එය පසුව නිවැරදි කරන නිසා) අනාගතයේදි මෙවැනි අඩුපාඩු සිදුනොවීමට පරිපූරක ඇස්තමේන්තු මගින් ලබා පසුව ලබාගත යුතු අය මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | 2019 වර්ෂයේ මාරු කරනු ලැබූ සහ පරිත්‍යාග මගින් පවරන ලද නිශ්චල දේපළ සඳහා මුද්දර ගාස්තු රු.50,829,200ක්, පළාත් භාණ්ඩාගාරයට ගෙවිය යුතු 1%ක ගාස්තු සහ ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාට ගෙවිය යුතු රු. 137,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අනාගතයේදි එය නිවැරදි කළ යුතුවේ. | මෙම වර්ෂයේදී වෙනමම ගිණුමේ වගුවක් මගින් ඉදිරිපත් කර ඉතිරි මුදල ගිණුම්වලට ගනු ලැබේ. එබැවින් ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. |
| (උ) | 2003 වර්ෂයේ අතුරුදහන් වූ රු.6,860,650ක් වූ වතුර බවුසරය සහ රෝද හතරේ ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්වලින් ඉවත්නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා තිබුණි. | අතුරුදහන් වූ වත්කම් වල අගය පොත්වලින් ඉවත් කළ යුතු වේ. | මේවාට නිසි පොලිස් වාර්තා නොමැති නිසාම මේවා පොත්වලින් කපාහැරීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබේ. ඉදිරියේදි නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය ගේ උපදෙස් ලබා කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | 2018 වර්ෂයේදි GIZ ආයතනයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ සූර්ය විදුලිජනන යන්ත්‍ර යේ පිරිවැය වූ රු.මිලියන 05 මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වත්කම් අගය මූල්‍ය ප්‍රකාශන වලට ගැලපිය යුතුවේ. | දැනට මෙය ක්‍රියාත්මක කිරිමට කටයුතු කරමින් පවතින අතර මෙහි මුළු වටිනාකම මෙම වර්ෂයේ ගිණුම්ගත කෙරේ. |
| (එ) | රු. 25,353,479 කට මිලදී ගත් අනෙකුත් ද්‍රව්‍ය (කම්බි, සිමෙන්ති, ගල්, තාර, පොලිතීන්වලින් භාවිතා නොකළ ප්‍රමාණය) වටිනාකම වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | ගබඩා ගිණුම් නඩත්තු කළ යුතුවේ. | ගබඩා ගිණුම් නඩත්තු නොකිරීම නිසා මේවා ගිණුම්ගත කිරිමට නොහැකි වි තිබේ.එසේ වුවත් ඉතිරි ද්‍රව්‍ය ගබඩාවේ තොග වශයෙන් පවති. වර්තමානයේ ගබඩා ගිණුම් පවත්වාගෙන යනු ලබන නිසා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවේ. |
| (ඒ) | අතුරුදහන්වූ, විනාශ වූ පුස්තකාල පොත් අවසන් තොගයෙන් අඩුනොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා තිබුණි. | නිවැරදි අගය හඳුනා ගෙන පොත් වලට ගැලපිය යුතුවේ. | අතුරුදහන්වූ, විනාශ වූ පුස්තකාල පොත්වල වටිනාකම පසුගිය වර්ෂවල වාර්තා නොමැති හෙයිනුත් (වටිනාකම් නොමැත), විස්තර ලබාගත නොහැකි බැවිනුත් ඉවත් කළ නොහැකිව තිබේ. දැනට මේවා මෘදුකාංගයක් මගින් ලේඛනගත කිරිම නිසා ඉදිරියේදී මෙවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. |
| (ඔ) | ආයුර්වේද වෛද්‍ය ශාලාවේ බෙහෙත් වර්ගවල තොග සමීක්ෂණය කර අවසන් ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි. | බෙහෙත් වර්ග වල තොග අගයන් නිවැරදිව ගිණුම්වලට ගත යුතු වේ. | ආයුර්වේද වෛද්‍ය ශාලාවේ බෙහෙත් ද්‍රව්‍ය තොග මාසිකව වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණත්, ඒවා අවසන් ගිණුම්වල හෙළිදරව් නොකරන ලදි. ඉදිරි කාලයේදි මෙය ලැයිස්තුවක් මගින් හෙළිදරව් කෙරේ. |

**1.3.2 ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දැක්වීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු. 341,832,339 ක් වූ ගිණුම් විෂයයන් 5 කට අදාල ඔප්පු, වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීම් ලියවිලි ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායත ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | මේ සියල්ල සඳහා වූ වටිනාකම්, කමිටුවක් පත්කර ලැයිස්තුගත කර තක්සේරු කරන අතර ඉතිරිය කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සැපයුම් ණයහිමියන්ට ගෙවිය යුතු රු. 28,808,920 ක් අඛණ්ඩව වර්ෂ 05 ක අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණත්, අදාල සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතු නොවීය. ඒනිසා මෙම ශේෂය තහවුරු කළ නොහැකිව තිබුණි. | කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂ කිහිපයක සිට මෙම ශේෂය තහවුරු කර ගත නොහැකිව තිබෙන නිසා මෙම වර්ෂයේදි මෙය ගැලපීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ගබඩා අත්තිකාරම් ගිණුමේ 2018 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන ගබඩා තොග ශේෂය රු.57,413,793ක් වුවත්, මෙම වටිනාකමට සමාන තොග විස්තර සභාවේ නොමැති විය. මේ නිසා මෙම වටිනාකම තහවුරු කළ නොහැකි විය. | තොග විස්තර ඉදිරිපත් කළ යුතුවේ. | දැනට 2019.12.31 දිනට අදාල ගබඩා භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඉන් බහුතරයකට පිරිවැය තක්සේරු කර මුළු එකතුව ලබාගෙන ඇත.නමුත් ඇතැම් අයිතමයන් සඳහා වටිනාකම තක්සේරු කර නොමැති නිසා ඒවායේද වටිනාකම තක්සේරු කර දැනට 2020 වර්ෂයේ ගබඩා ගිණුම නැවතත් ක්‍රියාත්මක කරනු ලැබේ. |

## 1.4. අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 | 3,721,196 | වර්ෂ දෙකකට අධික කාලයක සිට පැවැත එන, තැන්පතු, සම්බනධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි |
| (ii) | මුදල් රෙගුලාසි 1645 | | ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට | නිවැරදි පිළිවෙත් අනුගමනය | අදහස් දක්වා නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉදිරිපත් කර නොතිබුණි. | කළ යුතු වේ. | |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1(ඇ) මාර්ගෝපදේශය | ට්‍රැක්ටර් 04 ක්, ගාබේජ් කොම්බැක්ටර් 02 ක් සහ මිනි එක්ස්කැවේටර් ආදී මිලදී ගැනීම්වලදී පෙර සුදානම් රැස්වීම් (pre bids meeting) පවත්වා නොතිබුණි. | නිවැරදි ප්‍රසම්පාදන පිළිවෙත් අනුගමනය කළ යුතු වේ. | පිළිතුරු සපයා නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 87,466,270 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 95,843,811 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් සහ රැස්කළ ආදායම් ආදායම්

------------------------------------------------------------------------------------

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ කළ ආදායම් සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

**විගණන නිරීක්ෂණ**

-----------------------

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 31,500,000 | 58,757,243 | 41,232,501 | 17,524,742 | 23,800,000 | 47,230,435 | 20,541,050 | 26,689,385 |
| කුලී | 22,850,100 | 28,351,378 | 12,534,754 | 15,816,624 | 28,750,100 | 30,374,729 | 14,015,125 | 16,359,604 |
| බලපත්‍ර ගාස්තු | 11,640,000 | 13,427,672 | 10,683,589 | 2,744,083 | 11,145,000 | 13,036,787 | 10,949,115 | 2,087,672 |
| අනෙකුත් ආදායම් | 101,405,000 | 4,296,569 | 3,678,961 | 617,608 | 89,385,000 | 4,591,291 | 3,944,722 | 646,569 |
| එකතුව | **167,395,100** | **104,832,862** | **68,129,805** | **36,703,057** | **153,080,100** | **95,233,242** | **49,450,012** | **45,783,230** |

#### 2.2.2 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ නිශ්චල දේපල 42,477 ක් මත වරිපනම් තක්සේරු නොකර නිශ්චල දේපල | ද්විලියාපදිංචිය වැලැක්වීමට කටයුතු කළ යුතු වේ. | දේපළ සංඛ්‍යාවෙහි ඇතැම් දේපළ දෙවරක් ලියාපදිංචි කර හා ඇතැම් ඒවා මහ නගර සභා ආඥාපනතට අනුව ලියාපදිංචි නොවීත් පවති. එම |

| | | |
|---|---|---|
| 38,476 ක පමණක් වරිපනම් බදු තක්සේරු කර තිබුණි. | | නිසා මේවා නිවැරදි කිරීමේ ක්‍රියාත්මක වෙමින් පවතී. ඉදිරියේදි මෙම අඩුපාඩු නිවැරදි කෙරේ. |
| (ආ) වරිපනම් බදු අයකිරීම සඳහා 2012 වර්ෂයෙන් පසුව දේපළ නැවත තක්සේරු කර නොතිබුණි. | නව දේපළ නැවත තක්සේරු කිරීම් කඩිනමින් සිදු කළ යුතුවේ. | නව වරිපනම් සඳහා නැවත තක්සේරු කිරීම ඉදිරි කාලයේදී සිදුකිරීමට අදහස් කර ඇත. |

**2.2.3.** සංචාර නිකේතනවල ආදායම් මත බදු

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහනගර සභා බල ප්‍රදේශයේ පවතින හෝටල් මත අයකළ යුතු බදු මුදල් ගණනය කර අයකරගෙන නොතිබුණි. | හෝටල් මත බදු නිසි පරිදි අය කළ යුතුවේ. | ඔබ විසින් යවනු ලැබූ සංචාරක හෝටල්වල ආදායම් පිළිබඳ හිඟ ආදායම් විස්තර අදාල සංචාරක හෝටල්වලට 2019.09.03 දින යවා ඇත. ඉදිරියේදි 1%ක් අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4** මුද්දර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2016, 2017 හා 2018 වර්ෂයන්හි ඍජුව හා ජංගම සේවාවන් මඟින් අයකරනු ලැබූ අමතර මුද්දර ගාස්තු ගණනය කර අයකිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | ජංගම සේවා මගින් අමතරව අයකළ දේපළ වටිනාකම් සඳහා මුද්දර ගාස්තු ආපසු ගෙවන ලෙස අප විසින් 2019.05.22 දින ලිපි යවා ඇත. |

**3.** කාර්යසාධනය

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| මහනගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාරව, මුඛ්‍ය කරුණු සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | ප්‍රධාන කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | පළාත් සභාව රැස්වීමෙන් පසුව ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාමාර්ග අප විසින් ගනු ලැබේ. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------------

| | | |
|---|---|---|
| මහ නගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාර අතුරු ව්‍යවස්ථා සකස් කර ඒ අනුව සභාවේ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වුවත්, එම කාර්යයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සුදුසු අයුරින් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | අපගේ සියළුම ශාඛාවලට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද, අතුරු ව්‍යවස්ථා පදනම් කරගත් වාර්ෂික ක්රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. ඉදිරි අනාගතයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කෙරේ. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

| | | |
|---|---|---|
| තිරුප්පෙරුමතුරෙයිහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වඩාත් විධිමත්ව පරිසරයට හානි නොවන අයුරින් සිදුකර ගෙන යාම සඳහා 2016 වර්ෂයේ රු. 616,090 ක් සහ 2018 වර්ෂයේ රු. මිලියන 50 ක් වටිනා Land Cruiser වාහනයක් UNOPS ආයතනයෙන් ලබා දී තිබූ නමුත්, මෙම අරමුදල් මෙම අරමුණු සඳහා භාවිතා නොකර රු. 541,090 ක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. රු. 75,000 ක් වෙනත් අරමුණු සඳහා භාවිතා කර තිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ලබාදුන් අරමුදල් අදාල අරමුණු සඳහා භාවිතා කළ යුතුවේ. | UNOPS ආයතනයෙන් ලබාදුන් රු.616,090 කින් රු. 75,000 ක් අප මහනගර සභාවේ Website ස්ථාපිත කිරීමට භාවිතා කර තිබුණි. ඉතිරි රු.541,090 ක් වර්තමානයේ ඝන අපද්‍රව්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කෙරේ. එහි දැනට හිඟ මුදල් රු.395,494 ක් වේ. |

(ඇ) **පාරිසරික ගැටළු**

-----------------------

| | | |
|---|---|---|
| උරා ගැනීමේ (Sucker) යන්ත්‍රය මඟින් රැස්කරන මල අපද්‍රව්‍ය සභාවට අයත් නොවන තිරුප්පෙරුම්තුරෙහි අනුමත පවිත්‍රතා ක්‍රමවේදයට පටහැනිව බැහැර කිරීම නිසා මඩකලපුව වැව දූෂණය වී තිබුණි. | පවිත්‍රතා ක්‍රම වේදයට අනුව මල අපද්‍රව්‍ය බැහැර කල යුතු වේ. | අදාළ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය ජපාන ආයතනයක් විසින් නියමිත තාක්ෂණික ක්‍රමයන්ට අනුකූලව අප සභාවට පවරා දුන් අතර මේ සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කාලයෙන් කාලයට වාර්තා ලබාගෙන ඔවුන්ගේ නිර්දේශ අනුව නියමිත අයුරින් අප විසින් නඩත්තු කරන්නෙමු. |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | **අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කර නොගැනීම**<br>**-----------------------------------**<br>ජීව වායු නිෂ්පාදනය සහ රෝහල් අපද්‍රව්‍ය පිලිස්සීම සඳහා පිළිවෙලින් රු.මිලියන 02ක් සහ රු. මිලියන 03ක් වැයකර තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිඵල (outcome) ළඟා කරගෙන නොතිබුණි. | නිවැරදි ශක්‍යතා අධ්‍යයනය සිදු කළ යුතු වේ. | දැනට ජීව වායු නිෂ්පාදන කටයුතු සිදුවෙමින් පවතින නමුත් එය ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් උදා වී ඇත. හේතුව අප හට ආසන්නයේ පවතින පොලිස් ස්ථානයට ලබාදීමට තීරණය කර ඔවුනට ලිපි යැවූ නමුත් ඔවුන්ගෙන් පිළිතුරු නොලැබීම නිසා අපහට ජනතාවගේ විරෝධය හේතුවෙන් මෙය ස්ථාපිත කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. |

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**---------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙවන සෞඛ්‍ය වැඩසටහනේ (2nd HSDP)මූල්‍යාධාර යටතේ පෞද්ගලික වෛද්‍යායතනවල අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා 2014 වර්ෂයේදී මිලදී ගත් රු.2,624,800 ක් වටිනා Medical Waste Incinerator යන්ත්‍රය පසුගිය වර්ෂ 04 ක කාලයක සිට මේ දක්වා නිෂ්කාර්යව පැවතුණි. | අදාල අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය අදාල අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ අදාල කාර්යයන් ආරම්භ කර ඇත. මෙයට අදාළ තාක්ෂණික උපදෙස් ලබාදීමේ ඉංජිනේරුවරයා චීන ජාතිකයෙකු වීම නිසා ඔහු මෙහි සිටි අවස්ථාවේදී මෙය ඉදිකිරීමට නොහැකි වීමෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් පවතී. |
| (ආ) | මහනගර සභා බල ප්‍රදේශයට අයත් පුද්ගලික ඉඩමක්, කට්ටි කර විකිණීමේදී ඉන් කොටසක් මහනගර සභාවට පොදු පහසුකම් සඳහා පැවරිය යුතුය. මෙලෙස මහනගර සභාවට පැවරූ පර්චස් 97 ක පමණ රුපියල් මිලියන ගණනක් වටිනා ඉඩම් 05 ක් හිටපු ආණ්ඩුකාරවරයා විසින් ඔහුගේ බිරිඳගේ නමටත් ඔහුගේ නමටත් 2003-2006 කාලපරිච්ඡේදයේ පවරාගෙන තිබුණි. මේ පිළිබඳ මාගේ පසුගිය විගණන වාර්තාවෙන් අනාවරණය කර තිබූ නමුත් මේ පිළිබඳ සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ පිළිබඳව ඉක්මන් විමර්ශණ පැවැත්විය යුතු වේ. | මෙවැනි සිදුවීම් වර්ෂ කිහිපයකට පෙර සිදු වූ බැවින් මෙය සමීක්ෂණය කිරීම සඳහා කාල අවකාශයක් අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.මිලියන 02 ක පමණ වියදමකින් දිරන කසළවලින් (Degradable waste) ජීව වායු (Bio Gas) නිපදවීම, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැනි වාසිදායක අන්තර්ගත Bio Gas Plant එකක් 2018 පෙබරවාරි මාසයේ ඉදිකර අවසන් කළ බව මහනගර සභාවේ සභාපතිවරයාත් අදාල කොන්ත්‍රාත් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී අතරත් ගිවිසුමක් 2018 පෙබරවාරි මාසයේ අත්සන් කර 2018 සැප්තැම්බර් මාසයේ වැඩ අවසන්ව තිබුණත් මේ දක්වා Bio Gas නිෂ්පාදනය සිදුකර නොතිබුණි. | ජීව වායු නිපදවීම ඉක්මන් කළ යුතු වේ. | Bio Gas Energy කටයුතු 2018 පෙබරවාරි 19 සිට නිෂ්පාදන කටයුතු ආරම්භ කළ යුතු බව සඳහන් කළද, මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස 1000 Kg ක ගොම එකම ගුණත්වයෙන් එක්රැස් කළ යුතුවේ. ගොම සඳහා හිඟයක් පැවතීම නිසා මේවා එකතු කිරීමෙහි කාලය ප්‍රමාද වීමක් සිදුවේ. මේ නිසා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමෙහි දුෂ්කරතා පවතී. මෙම ව්‍යාපෘති යෝජනා ක්‍රමයෙහි සඳහන් කළ පරිදි මෙම ඉලක්කය ළඟා කරගැනීමට නොහැකි වුවත්, ඉදිරියේදී අප විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඈ) | මහනගර සභා ආඥා පනතේ (Cap 252) 185 සහ 186 වගන්ති ප්‍රකාරව, වර්ගීකරණය නොකළ ලැබීම් සභාවේ අරමුදලට එකතු කිරීම හැර, කලින් ප්‍රතිපාදනය නොකළ වියදම් සහා අරමුදල් මඟින් සිදුකිරීම කළ නොහැකිය. නමුත් 2019 වර්ෂයේදී අත්තිකාරම් ලෙස දක්වා තිබූ කිසිඳු ප්‍රජා මධ්‍යස්ථානයක් සමඟ සභාව ගනුදෙනුවල නියැලී නොතිබුණත්, සභා බල ප්‍රදේශයට අයත් ප්‍රජා මධ්‍යස්ථාන 14 කට විගණන දිනය දක්වා ලබාදුන් රු.12,620,559ක අත්තිකාරම් නිරවුල් කළ බවට (No cash) ලදුපත් (ම.ම.ස. 47 ) මහනගර සභාව විසින් ලබා දී තිබුණි. | මෙම ක්‍රියාව අදාළ පනත ඉක්මවා යාමක් ලෙස සැලකේ. | මහනගර සභා ආඥා පනතේ 40 (අ) වගන්තියේ ප්‍රතිපාදනවලට අනුව ඇතැම් භාණ්ඩ, මානව සම්පත් හා වාහන ලබා දී තිබුණි. |
| (ඉ) | මහනගර සභාවේ ජංගම ගිණුම් 2 ක මාසිකව අතිරික්ත ලෙස ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සිදුකර ඉතිරියක් වුවහොත් ඉතිරි ශේෂය ස්ථාවර තැන්පතුවක හෝ නැතහොත් ලංකා බැංකුව Overnight ගිණුමක් සහ මහජන බැංකුවේ Saving Corporation ගිණුමක් පවත්වාගෙන ගියේ නම් සභාවට 2018 වර්ෂය සඳහා රු.6,773,164 ක් සහ 2019 වර්ෂයේ රු. 7,126,252 ක්ද පොලී ආදායම් උපයා ගත හැකිව තිබූ ඉහත ආදායම් මූලාශ්‍ර හඳුනා නොගැනීම නිසා | අතිරික්ත මුදල ආයෝජනය කළ යුතු වේ. | සභාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙක බැංකුව සමඟ සාකච්ඡා කර ඉදිරියේදී මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | සභාවට රු.13,899,416 ක පොලී ආදායම් අහිමි වී තිබුණි. | | |
| (ඊ) | නැගෙනහිර පළාත් සභාවෙන් ලබාදුන් උපමාන පාදක ප්‍රදාන (CBG) රු. 10,435,141ක් අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂ 04කට අධික කාලයක් අඛණ්ඩව බැංකු ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි. | ප්‍රතිලාභ ලැබෙන පරිදි මුදල් ආයෝජනය කළ යුතුවේ. | පසුගිය වර්ෂ කිහිපයක සිට මෙම වටිනාකම අදාල අරමුණ සඳහා උපයෝජනය කළ නමුත් මෙලෙස ඉතිරියක් ඇතිවීමට හේතු ඇස්තමේන්තු වටිනාකමට වඩා කාර්යය අඩුවෙන් කිරීම හෝ ගිවිසුම් සඳහා එළැඹීමේදි තරගකාරි බව හේතුවෙන් අඩුවට ලැබු නිසා සිදු වු ඉතිරියක් වීමටද හැකිය. කෙසේ නමුත් මින් ඉදිරියේදි මෙවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන අතර ලබන වර්ෂයේ මෙය සභාවේ අනුමැතියෙන් පොදු තැන්පත් ගිණුමට මාරු කර සමුච්චිත අරමුදලට එකතු කරනු ලැබේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු 126 ක් සහ අතිරික්ත සේවකයින් 13 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු අතර අතිරේක සේවකයින් සඳහා අනුමැතීන් ලබාගත යුතුවේ. | අපගේ කාර්යාලය විසින් තනතුරු පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ වාර්තාව නැගෙනහිර පළාත් පාලන කොමසාරිස්වරයාට යවනු ලබන අතර පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර ගන්නා ලෙසට ඉල්ලීම් කරමින් පියවර ගෙන ඇත. |

**3.3 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාව විසින් 2019 පළාත් විශේෂ සංවර්ධන ආධාර පදනමින් (PSDG) සත්තුරුක්කොන්ඩාන් ඕසානම් මාර්ගය රු. මිලියන 5.25 කට සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා අක් මුදල් ලෙස රු.5,070,450 ක් කොන්ක්‍රීට් මිශ්‍රණය | ගෙවීම් කිරීමේදී ඉදිරි අවදානම් අනුගමනය කළ යුතු වේ. | PSDG ව්‍යාපෘතිය යටතේ ඕසානම් මාර්ගයට 283m³ ප්‍රමාණයේ Ready-mix අත්තිකාරම් නිරවුල් කර තිබුණි. නමුත් ඉංජිනේරුවරයාගේ වාර්තාව අනුව (Job Sheet) 324m³ ක් භාවිතා කර තිබුණි. ඒ අනුව තවදුරටත් ඉතිරි මුදල් ගෙවිය යුතුව ඇත. |

(Ready mix) 283m³ ප්‍රමාණයට උපයෝජනය නොකළ අත්තිකාරම් ගිණුම නිරවුල් කර තිබුණි. නමුත් ඉංජිනේරුවරයාගේ වාර්තාව අනුව, ඉහත මාර්ගයට 210m³ ප්‍රමාණයක කොන්ක්‍රීට් මිශ්‍රණයක් පමණක් දමා තිබූ බවට වාර්තා කර තිබුණි. මෙම ලේඛන පදනම් කරගැනිමේදී 75m3 ප්‍රමාණයක කොන්ක්‍රීට් මිශ්‍රණයක් සඳහා අමතර රු.989,541ක් ගිණුම්වල ඉදිරිපත් කර තිබුණි.

### 3.3.1 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ GIZ ආයතනයෙන් මහනගර සභාවට පරිත්‍යාග කළ 6.125Kw සූර්යබල විදුජනක යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | නියමිත කාලය තුළ අළුත්වැඩියා කළ යුතු වේ. | විදුලි කෙටීම, අකුණු සැර වැදීම වැනි හේතු නිසා මෙම සූර්යබල විදුලිජනක යන්ත්‍රය ක්‍රියාත්මක නොවීමෙන් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අදාළ සමාගමට ආපසු යවා ඇති බව දන්වා සිටිමි. |

### 3.3.2 වාහන නඩත්තු කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ පවතින වාහන 77 කින් වාහන 24 ක් ධාවනයේ නොපැවතුණි. මේවා ධාවන තත්ත්වයට පත් කිරීමට හෝ මේවා වෙනත් ආයතනවලට ලබාදීමට හෝ ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ධාවනයේ නොයෙදෙන වාහන අලුත්වැඩියා කර පාවිච්චි කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කල යුතු වේ. | වාහන 77 න් වාහන 7 ක් වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇත. වාහන 22 ක් ඉදහිට ධාවනයේ යොදවයි. ඉතිරි වාහන මුළුමනින්ම භාවිතා කෙරේ. |
| (ආ) | සභාවේ ධාවන තත්ත්වයේ මෝටර් රථ 48ක් වර්ෂ 03 කට අධික කාලයක සිට ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | අනාගතයේදී සියළුම වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කෙරේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන කාර්යයන් විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යයන් විධිමත් කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ සුළු වශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදුවිය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර රැස්වීම් පවත්වා නොතිබුණි. | රැස්වීම් හතරක් පැවැත්විය යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පවත්වා තිබුණු අතර 03 ක් පැවැත්වීමට සැලැසුම් කර ඇත. |

### 4.3 නිරවුල් නොකළ විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහනගර සභාව පිළිබඳව 2018 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ අංක 1.6.1 ආ, 1.6.2, 2.2.2.1, 2.2.2.2 සහ 3.1 දරන විගණන ඡේදවලින් අනාවරණය කරන ලද අඩුපාඩු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මහජනතාවගේ බදු මුදල්වලට සිදුවූ පාඩු වහාම අයකර ගත යුතුවේ. | ඔබ විසින් සඳහන් කළ නිරවුල් නොකළ විගණන ඡේද මෙම වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |